සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

ආර්ථික විද්‍යාව I

13 ශ්‍රේණිය
Grade 13

පෙරහුරු ප්‍රශ්න පත්‍රය 2022 ජූනි

කාලය පැය තුනයි
විනාඩි 10

SPED(DEV)/FIRST-2022/A/L


උපදෙස්:*සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

*1 සිට 50 තෙක් ප්‍රශ්න වලට අදාළව වඩාත් නිවැරදි පිලිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1) සම්පත් හිඟකම නිසා,
   1. සෑම සමාජයක්ම ඉල්ලුම් සැපයුම් බලවේග යටතේ ආර්ථිකය මෙහෙය විය යුතුය.
   2. පවත්නා සම්පත් වල විකල්ප භාවිත අතුරෙන් තේරීම් කිරීමට සෑම සමාජයකටම සිදුවේ.
   3. සෑම සමාජයකටම මූලික අවශ්‍යතාවත් ඉටු නොවන පිරිසක් සිටිය යුතුමය.
   4. සම්පත් වල භාවිත ප්‍රමාණය ඉක්මවූ සම්පත් ප්‍රමාණයක් දක්නට ලැබේ.
   5. හිඟකම තීව්‍ර වනුයේ දිළිඳුකම ප්‍රබල වන විටදීය.

2) පහත සඳහන් ප්‍රකාශ අතුරින් අසත්‍ය ප්‍රකාශය කුමක්ද?
   1. සේවා වියුක්ත ජනගහනය ශ්‍රම බලකායට අයත්වේ.
   2. ශ්‍රම බලකාය සහභාගිත්ව අනුපාතය ඉහළ යාමට ශ්‍රම බලකාය සාපේක්ෂව ඉහළ යා යුතුය.
   3. නිශ්චිත කාල පරිච්ඡේදයක් තුල ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් යොදවන කායික හා මානසික වෙහෙස ශ්‍රම සැපයුමයි.
   4. මිනිසාගේ දියුණු කර ගන්නා ලද දක්ෂතා නිපුණතා මෙන්ම පුහුණුව ප්‍රාග්ධන සම්පත් භාවිතය හා ශ්‍රම විභජනයද ශ්‍රම ඵලදායිතාව ඉහළ නංවයි.
   5. ව්‍යවසායකයා අවධානම් දරා නවෝත්පාදන බිහි නොකරන්නේ නම් නව භාණ්ඩ වෙළෙඳ පොළට නොලැබේ.

3)



2010 ට වඩා 2020 දී නිෂ්පාදන හැකියාව වැඩිවූ ආකාරය රූප සටහනේ දැක්වේ.ඒ අනුව සහල් නිපදවීමේ ආවස්ථික පිරිවැය 2010 හා 2020 පිලිවෙලින්.

1) ab සිට cd දක්වා. **II.** ac සිට cd දක්වා. **III.** ab සිට e f දක්වා

IV. ab සිට b c දක්වා. **V.** ac සිට bd දක්වා

4) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක නිමවුම් සංයෝගය වම්පස ලක්ෂයක් කරා ගමන් කිරීමට හේතු විය හැක්කේ,

I. ආර්ථික බිඳ වැටීමක්. ii.සිවිල් අරගල පැවතීමක්. iii.ආර්ථික උත්පාත තත්වයක්.

iv.ඉතා දැඩි විදේශ සම්බාධක පැනවීමක්. V. ආර්ථික පසු බැස්මක්

5) සැලසුම් ආර්ථිකයක දැකිය නොහැකි ලක්ෂණයක් වන්නේ.

i. සැලසුම් යාන්ත්‍රණයෙන් තිරණ ගැනීම. ii. රජයේ දේපොළ අයිතිය.

iii.විධාන පදනම් කරගත් සානුබල පැවතීම. iv.බලය විමධ්‍යගතව පැවතීම.

V.මිල මඟින් භාණ්ඩ හා සේවා වල වටිනාකම තක්සේරු කිරීම.

6) වෙළෙඳ පොළ ආර්ථිකයක සම්පත් බෙදා වෙන් කිරීමේ ගැටළුව විසඳීමට ප්‍රබලවම බලපෑම් කරනු ලබන්නේ.

i.භාණ්ඩ හා සේවා වෙළෙඳ පොළේ සාපේක්ෂ මිලයි. ii.සාධක වෙළෙඳ පොළේ මිල ගණන්ය.

iii.මූල්‍ය වෙළෙඳ පොළේ පවතින තත්වයන්ය. iv.සැලසුම් යාන්ත්‍රණයවේ.

V.විධාන බලතල මත එය සිදුවේ.

7) පාරිභෝගික ඉල්ලුම් වක්‍රයක් අඳින විට ස්ථාවර නැතැයි උපකල්පනය කරනුයේ ,

i.සළකා බලන භාණ්ඩයේ මිල. ii. පාරිභෝගිකයන්ගේ සංඛ්‍යාව. iii. ආදායම් මට්ටම.

iv.ව්‍යාපාරිකයින්ගේ අරමුණු. v. අනාගත භාණ්ඩ මිල වෙනස්වීම පිළිබඳ අපේක්ෂා

8) නිෂ්පාදන අතිරික්තය ශූන්‍ය වන්නේ,

I. ඉල්ලුම පූර්ණ මිල නම්‍යතාවයයෙන් යුක්ත වීම.
II. ඉල්ලුම පූර්ණ මිල අනම්‍යතාවයයෙන් යුක්ත වීම.
III. සැපයුම පූර්ණ මිල නම්‍යතාවයයෙන් යුක්ත වීම.
IV. සැපයුම පූර්ණ මිල අනම්‍යතාවයයෙන් යුක්ත වීම.
V. ඉල්ලුම් සැපයුම් නම්‍යතාවයන් ඒකීය නම්‍ය වීම.

9) නිෂ්පාදකයෙක් තම ලාභ තීරුව වැඩි කර ගැනීම සඳහා **නොකළ යුතු** දෙයක් වන්නේ.


I. නම්‍ය භාණ්ඩයක් නම් මිල පහළ දැමීම.
II. පූර්ණ අනම්‍ය භාණ්ඩයක් නම් මිල ඉහළ දැමීම.
III. අනම්‍ය භාණ්ඩයක් නම් මිල ඉහළ දැමීම.
IV. ඒකීය නම්‍ය භාණ්ඩයක් නම් මිල ඉහළ දැමීම.
V. ඒකීය නම්‍ය භාණ්ඩයක් නම් මිල වෙනස් නොකිරීම.

10) පහත සඳහන් අවස්ථා අතුරෙන් නිෂ්පාදන ආයතනයේ මුළු අයභාරය පහළ බසිනුයේ නිශ්චිතවම කවර අවස්ථාවකද?

I. සැපයුම නම්‍ය තත්වයකදි මිල පහළ යන විට.
II. ඉල්ලුම නම්‍ය තත්වයකදි මිල පහළ යන විට.
III. ඉල්ලුම අනම්‍ය තත්වයකදි මිල ඉහළ යන විට.
IV. ඉල්ලුම නම්‍ය තත්වයකදි මිල ඉහළ යන විට.
V. ඉල්ලුම ඒකීය නම්‍ය තත්වයකදි මිල පහළ යන විට.

SPEEDLEVEL FIRST 2022 A/L

11)



මෙම ඉල්ලුම් වක්‍රයට අදාළ ඉල්ලුම් සමීකරණය වන්නේ,

I. Qd=200-5p ii. Qd=200-6p iii. Qd=150-3p iv. Qd=180-5p v. Qd=200-3p

12)වෙළෙඳ පොළේ සිටින එක් සැපයුම්කරුවකු තම මුළු අයභාරයෙන් ඔහුගේ මුළු විචල්‍ය පිරිවැය අඩු කරනු ලැබීය.එමඟින් ලැබෙන පිළිතුර සමාන වනුයේ.

i. ප්‍රාමාණික ලාභයට ii. ආර්ථික ලාභයට iii.මුළු ස්ථාවර පිරිවැයට
Iv. නිෂ්පාදන අතිරික්තයට V. නිෂ්පාදන පිරිවැයට

13) නම්‍ය ඉල්ලුමක් පවතින්නේ නම්,

i. මිල වැඩිවන විට පාරිභෝගික පැහැදීම වැඩිවේ. ii. මිල අඩුවන විට නිෂ්පාදන අයභාරය වැඩිවේ.
iii. මිලට ඉල්ලුම දක්වන ප්‍රතිචාර පහළ අගයක් ගනී. iv. ලාභ ලැබීමට මිල වැඩිකල යුතුය.
v.රජය බදු පැනවීමෙන් ආදායම වැඩිකර ගත හැකිය.

14) එක්තරා භාණ්ඩයක මිල රු.5/- දී භාණ්ඩ ඒකක 80ක් මිලදී ගන්නා භාණ්ඩයක මිල රු.2/- දක්වා පහළ ගියයොත් භාණ්ඩ ඒකක 200ක් මිලදී ගනී.මෙම භාණ්ඩයේ නම්‍යතාවය,

i.පූර්ණ අනම්‍යවේ. ii. අනම්‍යවේ. iii.ඒකීය අනම්‍යවේ. iv.නම්‍යවේ. v.පූර්ණ නම්‍යවේ.

15) ආදායම් ඉල්ලුම් නම්‍යතාවය ධන අගයක් ගනු ලබන්නේ සාමාන්‍ය භාණ්ඩ සම්බන්ධයෙනි.ඒ අනුව ආදායම් ඉල්ලුම් නම්‍යතාවය 1.5 ගනු ලබන භාණ්ඩ වර්ගය.

i. අත්‍යවශ්‍ය භාණ්ඩවේ. ii. බාල භාණ්ඩවේ. iii.ගිෆන් භාණ්ඩවේ.

iv. ආදේශක භාණ්ඩවේ. V.සුඛෝපභෝගී භාණ්ඩවේ.

16) මිල රු.20/- දී සැපයුම් ප්‍රමාණය ශූන්‍ය වේ.මිල රු.60/- දන්වා ඉහල යන්නේ නම් රු.60/- දී සැපයුම් නම්‍යතාවය.

i.3කි. ii. 2.5කි. iii.1.5කි iv.0.33කි. v. නම්‍යතාවය සෙවීමට දත්ත ප්‍රමාණවත් නැත.

17) එක්තරා භාණ්ඩයක ඉල්ලුම් සමීකරණය **Qd=120-6p** වේ.සමතුලිත මිල රු.12/-වේ නම් එම අවස්ථාවේ පාරිභෝගික පැහැදීම හා පාරිභෝගික අතිරික්තය පිළිවෙලින්.


i.384 හා 288 කි. ii.384 හා 432 කි. iii.288 හා 288 කි. iv.432 හා 384 කි. V.576 හා 192 කි.

SPEED OF FIRST-2022A/L

18) එක්තරා සමතුලිත භාණ්ඩයක මිල හා ප්‍රමාණය පිළිවෙලින් රු.20/- හා ඒකක 400 විය.මෙම භාණ්ඩයට අදාළ ඉල්ලුම් වක්‍රයේ බැවුම් පරස්පරය ($\Delta Q/\Delta P$) -10 සිට -20 දක්වා වෙනස් වුවහොත් පැවති සමතුලිත මිල යටතේ,ඉල්ලුම් නම්‍යතාවය වෙනස් වන ආකාරය නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක්ද?

i. -0.5 සිට -1 දක්වා වෙනස්වේ. ii.-0.5 සිට -0.25 දක්වා වෙනස්වේ. iii. -0.2 සිට - 4 දක්වා වෙනස්වේ
Iv.-0.05 සිට - 2 දක්වා වෙනස්වේ v.-4 සිට - 1 දක්වා වෙනස්වේ.

19) පහත රූප සටහනේ දැක්වෙන්නේ කිසියම් භාණ්ඩයක් සම්බන්ධ ඉල්ලුම් සැපයුම් වක්‍රයන්ය.



මෙම භාණ්ඩයට රජය විසින් රු.5/-ක සහනාධාරයක් දෙනු ලබන්නේ නම් ,නිෂ්පාදකයාගේ අයභාරය හා පාරිභෝගිකයාගේ අතිරික්තය.

i.500 හා 750 කි. ii.1000හා 750කි. iii.1500 හා 250 කි. iv.500 හා 500 කි. V.625 හා 625 කි.

20) රජය බද්දක් පැනවූ විට මුළු බදු බර පාරිභෝගිකයා දරද්දි අහිමි වන සමාජ සුභ සාධනයක් නොමැති අවස්ථාව වන්නේ,

I. පූර්ණ නම්‍ය සැපයුමකදි හා පූර්ණ කම්‍ය ඉල්ලුමකදි.
II. පූර්ණ අනම්‍ය සැපයුමකදි හා පූර්ණ නම්‍ය ඉල්ලුමකදි.
III. පූර්ණ නම්‍ය සැපයුමකදි හා ඒකීය නම්‍ය ඉල්ලුමකදි.
IV. ඒකීය නම්‍ය සැපයුමකදි හා ඒකීය නම්‍ය ඉල්ලුමකදි.
V. ඒකීය නම්‍ය සැපයුමකදි හා පූර්ණ අනම්‍ය ඉල්ලුමකදි.

21) Qd=240-10p සහ QS= -60+15P වන භාණ්ඩයක් මත රු.14/- ක අවම මිලක් නියම කරනු ලැබුවහොත්,වෙළෙඳ පොළේ ඇතිවිය හැකි අධි සැපයුම හා අධි සැපයුම් මිල පිළිවෙලින්,

I. 75 හා 15කි. ii.50 හා 9 කි. iii.150 හා 5 කි. iv. 50 හා 5 කි. v. 150 හා 9 කි

22) ඒකීය නම්‍ය ඉල්ලුමක් හා පූර්ණ නම්‍ය සැපයුමක් පවතින භාණ්ඩයක් මත රජය සහනාධාර දෙන්නේ නම්,

I. මුළු සහනාධාරයේ වාසිය පාරිභෝගිකයා ලබයි ii. මුළු සහනාධාරයේ වාසිය නිෂ්පාදකයා ලබයි
iii. සහනාධාරයේ වාසිය සමානව බෙදී යයි. iv. සහනාධාරයේ වැඩි වාසිය පාරිභෝගිකයා ලබයි
v.සහනාධාරයේ වැඩි වාසිය නිෂ්පාදකයා ලබයි.

23) රජය සහතික මිලක් නියම කල විට,

I. නිමවුම වැඩිවීම සාමාන්‍ය තත්වයකි.
II. රජය අතිරික්තය මිලදි ගන්නේ නම් නිෂ්පාදකයාට වඩා පාරිභෝගිකයාට වාසිවේ.
III. රජය ඌණ පූරණ ගෙවීම් කරන්නේ නම් නිෂ්පාදකයාට මෙන්ම පාරිභෝගිකයාට ද වාසිවේ.
IV. රජය අතිරික්තය මිලදි ගන්නා නිසා පාරිභෝගිකයාට වාසිවේ.
V. සහතික මිලකදි රජය මැදිහත් නොවන්නේ නම් කළුකඩ මිලක් ඇතිවේ.

SPEDU EVOFIRST-2022A/L

24)ගොඩනැගිලි යන්ත්‍ර සූත්‍ර යොදා ගනිමින් හා ශ්‍රමය අමුද්‍රව්‍ය වැනි සාධක වැඩි කරමින් නිෂ්පාදනයේ යෙදෙන නිෂ්පාදන ආයතනයක යම් නිමැවුම් මට්ටමකට පසු,

I. හීනවන පරිමානුකූල ඵල ඇතිවේ. ii. හීනවන ආන්තික ඵල ඇතිවේ.
iii.වැඩෙන පරිමානුකූල ඵල ඇතිවේ. iv. ස්ථාවර පරිමානුකූල ඵල ඇතිවේ.
v.කෙටිකාලීන පිරිමැසුම් ඇතිකර ගනී.

25)පහතින් දැක්වෙන්නේ නිෂ්පාදන ක්‍රියාවලියක පිරිවැය වර්ග කිහිපයකි.

A.අමුද්‍රව්‍ය පිරිවැය B. ප්‍රාමාණික ලාභ C. ආර්ථික ක්ෂය වීම් D. නුපුහුණු ශ්‍රම පිරිවැය.

ඉහත පිරිවැය වර්ග අතුරින් ගෙවුනු (සෘජු) පිරිවැය හා ආරෝපිත (වක්‍ර) පිරිවැයට නිවැරදිව වර්ග කළ හැකි පිළිතුර කුමක්ද?

	ගෙවනු (සෘජු) පිරිවැය	ආරෝපිත (වක්‍ර) පිරිවැය
I.	A.B	C.D
II.	A.C	B.D
III.	A.D	B.C
IV.	B.D	A.C
V.	B.C	A.D

26)

නිමවුම්(ඒකක)	මුලු පිරිවැය(රු)	මුලු අයභාරය(රු)
1	4	10
2	9	20
3	15	30
4	23	40
5	33	50
6	45	60

ඉහත වගුවේ දැක්වෙන දත්ත වලින් පෙන්නුම් කෙරෙන නිෂ්පාදන ආයතනය

I. පූර්ණ තරහකාරී වෙළෙඳපළක ස්ථාවර ආන්තික පිරිවැය තත්වයක් යටතේ කටයුතු කරයි.
II. පූර්ණ තරහකාරී වෙළෙඳපළක අඩුවන ආන්තික පිරිවැය තත්වයක් යටතේ කටයුතු කරයි.
III. පූර්ණ තරහකාරී වෙළෙඳපළක වැඩිවන ආන්තික පිරිවැය තත්වයක් යටතේ කටයුතු කරයි.
IV. අපූර්ණ තරහකාරී වෙළෙඳපළක වැඩිවන ආන්තික පිරිවැය තත්වයක් යටතේ කටයුතු කරයි.
V. අපූර්ණ තරහකාරී වෙළෙඳපළක අඩුවන ආන්තික පිරිවැය තත්වයක් යටතේ කටයුතු කරයි.

27) පූර්ණ තරහකාරී වෙළෙඳ පොළක භාණ්ඩයේ වෙළෙඳ පොළේ මිල රු.24ක්ව තිබියදී ආයතනයක ආන්තික අයභාරය ආන්තික පිරිවැයට සමානවේ.නමුත් එම ආයතනයේ භාණ්ඩයේ සාමාන්‍ය විචල්‍ය පිරිවැය රු.28 %ක මට්ටමේ පවතී.මෙම තත්වය යටතේ කෙටි කාලයේදී ආයතනය ගත යුතු තාර්කික තීරණය වනුයේ.

I. ආර්ථික ලාභ උපයමින් රැඳී සිටීම. ii. පාඩු සහිතව නිෂ්පාදනයේ යෙදී සිටීම.
iii. ආර්ථික ලාභ ශූන්‍ය මට්ටමේ පවත්වා ගෙනයාම. Iv. නිෂ්පාදනය අත්හිටුවීමට තීරණය කිරීම.
v. ව්‍යාපාර ආයතනයේ ධාරිතාව පුලුල් කිරීමට තීරණය කිරීම.

28) පූර්ණ තරහකාරී කර්මාන්තයක ලක්ෂණයක් **නොවන්නේ** කුමක්ද?

I. දිගුකාලයේදී ප්‍රශස්ත ධාරිතාවයෙන් කටයුතු කරයි.
II. දිගුකාලයේදී ඇතැම් නිෂ්පාදන ආයතන අතිප්‍රාමාණික ලාභ ලබයි.
III. ආයතන බලවත් නැති කුඩා නිෂ්පාදකයින්ගෙන් සමන්විත වෙයි.

SPEEDEVO FIRST-2024/I

IV. අලාභ ලබන ආයතන වෙළෙඳ පළෙන් ඉවත්ව යයි.
V. පාරිභෝගික ශුභ සාධනය සැලසෙන ලෙස සම්පත් බෙදී යාම.


29) වරලත් ගණකාධිකාරීවරියක් මසකට රුපියල් 300000 ක වැටුපක් ලබයි.ඒ අතර ඇයගේ සුවිශේෂී ගායන කුසලතාවක් නිසා ජනප්‍රිය වීම හේතු කොට ගෙන ව්‍යක්තිය ගායිකාවක බවට මාරු වෙමින් රුපියල් 1000000 ක වැටුපක් ලබමින් කටයුතු කරමින් සිටී.මේ හා සම්බන්ධ පහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය වනුයේ කුමක්ද?

I. ඇයගේ සංක්‍රාම ඉපයුම් රුපියල් 700000 ක් වන අතර ආර්ථික බදු කුලිය රුපියල් 300000කි.
II. ඇයගේ සංක්‍රාම ඉපයුම් රුපියල් 300000 ක් වන අතර ආර්ථික බදු කුලිය රුපියල් 700000කි.
III. ඇයගේ සංක්‍රාම ඉපයුම් රුපියල් 1000000 ක් වන අතර ආර්ථික බදු කුලිය රුපියල් 700000කි.
IV. ඇයගේ ආර්ථික බදුකුළිය රුපියල් 1000000 ක් වන අතර සංක්‍රාම ඉපයුම් රුපියල් 700000කි.
V. ඇයගේ මුලු ඉපයුම් රුපියල් 1000000 ම ආර්ථික බදු කුලියකි.

30) ජාතික ගිණුම් වලට ඇතුලත් වන ඵලදායී ආර්ථික කටයුක්තක් වන්නේ කුමක්ද?

I. විශ්‍රාමික ගුරුවරයෙකුට ලැබෙන මාසික විශ්‍රාම වැටුප.
II. ජලාශයක පාලනයකින් තොරව ජනනහ වන මතස්‍ය තොගය.
III. නිෂ්පාදන සමාගමක කොටස් 1000ක් තැරැව්කරුවකු මඟින් මිලට ගැනීම.
IV. පැරණි නිවසක් මිලට ගැනීම වෙනුවෙන් තැරැව්කරුවකුට ගාස්තුවක් ගෙවීම.
V. නිවසක සමාජිකයින් තම දරුවන් අඅධ්‍යාපන කටයුතු වලට පාසලට රැගෙන යාම.

31) පහත දැක්වෙන්නේ කල්පිත වෙළෙඳ පොළ ආර්ථිකයක ව්‍යාපාර චක්‍රයකි.



ඉහත රූපසටහන අනුව නිමැවුම් A ලක්ෂයේ සිට B ලක්ෂයට මාරුවේ.නිවැරදි පිළිතුරු ඇතුලත් කාණ්ඩය වනුයේ කුමක්ද?

	අවධිය	සේවා ව්‍යුක්තිය	නිමැවුම් පරතරය	සමාහාර ඉල්ලුම
1	පසුබැසීම	වැඩිවේ	සෘණ	අඩුවේ
2	උත්පාදනය	අඩුවේ	ධන	අඩුවේ
3	පසුබැසීම	අඩුවේ	සෘණ	වැඩිවේ
4	ප්‍රසාරණය	වැඩිවේ	ධන	අඩුවේ
5	පසුබැසීම	අඩුවේ	සෘණ	අඩුවේ

32)නිෂ්පාදන මූලාශ්‍ර අනුව දළ එකතුකළ අගය නිවැරදිව දැක්වෙන්නේ

I.නිමැවුම් දළ වටිනාකම + අතරමැදි පරිභෝජනය II. නිමැවුම් දළ වටිනාකම - අතරමැදි පරිභෝජනය

III.සාධක ආදායම් +ස් ථාවර ප්‍රාග්ධන පරිභෝජනය IV. කෘෂිකාර්මික+ කාර්මික+ සේවා අංශ වල වටිනාකම

V. සාධක ආදායම් - ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය

SPED/G.C.E-2022A/L

33) එක්තරා ආර්ථිකයන පහත තොරතුරු සපයා ඇත.(රු.මිලියන වලිනි)

ශුද්ධ අපනයනය = -3050

සේවා ගිනුම (ශුද්ධ)(ගෙවුම් ශේෂයේසේවා ගිනුමේ ශේෂය) = 250

ප්‍රාථමික ආදායම් ගිනුම (ශුද්ධ) = -380 (විදේශිය ශුද්ධ ප්‍රාථමික ආදායම)

ද්විතියික ආදායම් ගිනුම (ශුද්ධ) = -1300 (විදේශිය ශුද්ධ වර්තන සංක්‍රාම)

දළ දේශිය වියදම = 10000

ඉහත ආර්ථිකයේ වෙළෙඳ මිලට දළ ජාතික ආදායම වනුයේ.

I.රු මිලියන 5270. II. රු. මිලියන 5670. III.රු.මිලියන6190 IV.රු.මිලියන 6570 V. රු.මිලියන 13300

34) විවෘත ආර්ථිකයක පහත තොරතුරු සපයා ඇත. (රු.බිලියන වලිනි)

ඉතුරුම් = 100 ශුද්ධ අපනයන = -5 අයවැය ශේෂය = -25

ආර්ථිකයේ ආයෝජන මට්ටම් වනුයේ

I. 125 II. 100 III. 80 IV. 70 V. 62

35)එක්තරා ආර්ධිකයක් සඳහා අදාල කාර්ව ආර්ථික දත්ත පෙළක් පහත දැක්වේ.(සියලු සංඛ්‍යා රුපියල් බිලියන වලින්)

රජයේ අවසන් පරිභෝජනය	1000
වැටුප් හා ශ්‍රමිකයන්ගේ වෙනත් අතිරේක ආදායම්	4000
ස්ථාවර ප්‍රාග්ධන පාරිභෝජනය	800
දළ ආයෝජනය	800
පෞද්ගලික පරිභෝජනය	4400
දළ දේශිය නිෂ්පාදිතය	5300
ශුද්ධ වක්‍ර බදු	300

මෙම ආර්ථිකයේ ශුද්ධ අපනයන අගය වනුයේ,

I. රුපියල් බිලියන 500කි. II. රුපියල් බිලියන -500කි. III. රුපියල් බිලියන 900කි.

IV. රුපියල් බිලියන -900කි. V. රුපියල් බිලියන 1000කි.

36)යම් වර්ෂයක උද්ධමන වේගය 3% කි.ජනගහන වර්ධනය 1% කි.ඒක ශීර්ෂ දළ දේශිය නිෂ්පාදිත වර්ධන වේගය 0%කි.නාමික දළ දේශිය නිෂ්පාදිතයේ වර්ධන වේගය වනුයේ.

I.1% කි II. 1.5% කි III. 2% කි IV. 3% කි V. 4% කි

SPED(DEVO)FIRST-2024/L

37) එක්තරා සරළ ආර්ථිකයක වැය කල හැකි ආදායම රු.2000 දී සාමාන්‍ය පරිභෝජන නැමියාව (APC) 0.8 ක් වන අතර වැය කල හැකි ආදායම රු.4000 දී සාමාන්‍ය පරිභෝජන නැමියාව (APC) 0.7 කි.මෙම ආර්ථිකයේ පරිභෝජන ශිතය වනුයේ

I. C=400+0.4y II. C=400+0.8y III. C=-400+0.4y IV. C=-400+0.6Y V. C= 400+0.7y

38) රජයේ කටයුතු ඇතුළත් සංවෘත ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය පහත පරිදි වෙයි.
C=100 + 0.8yd රජයේ ස්ථාවර බද්ද රු.මිලියන 40කින් වැඩිවේ යයි සිතන්න.සංක්‍රාම ලබාදීමක් සිදු නොවේ නම්,

I. ස්වායක්ත පරිභෝජනය රු මි 68 කි. II. ස්වායක්ත පරිභෝජනය රු මි 116 කි.
III. ස්වායක්ත පරිභෝජනය රු මි 126 කි. IV. ස්වායක්ත පරිභෝජනය රු මි 132 කි.
V.ස්වායක්ත පරිභෝජනය හෝ පෙළෙඹුණු පරිභෝජනයට බලපෑමක් ඇති නොවේ.

39) සරල ආර්ථිකයක සමාහාර ඉතුරුම් ශ්‍රිතයේ බෑවුම අඩුවීම නිසා ඇතිවිය හැකි ආර්ථික ප්‍රතිවිපාක වනුයේ

I. ගුණකයේ අගය වැඩිවීම හා සමතුලිත ආදායම ඉහල යාමයි.
II. ගුණකයේ අගය අඩුවීම හා සමතුලිත ආදායම ඉහල යාමයි.
III. ගුණකයේ අගය අඩුවීම හා සමතුලිත ආදායම පහල යාමයි.
IV. ගුණකයේ අගය වැඩිවීම හා සමතුලිත ආදායම පහල යාමයි.
V. ගුණකයේ අගය වැඩිවීම හා සමතුලිත ආදායම ස්ථාවරව පැවතීමයි.

40)පහත සඳහන් ප්‍රකාශ අතුරින් ජාතික පරිභෝජක මිල දර්ශකය සම්බන්ධයෙන් පමනක් නිවැරදි වන ප්‍රකාශය කුමක්ද?

I. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළියෙල කරයි. II. තොග මිල දර්ශනය වෙනුවට හඳුන්වා දෙන ලද්දකි
III. පදනම් වර්ශය 2013 වර්ෂයවේ IV. ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ග 22.1කි.
V.අන්තර්ගත භාණ්ඩ හා සේවා සංඛ්‍යාව 392 කි.

41)පහත සඳහන් කවර න්‍යායාත්මක ක්‍රියා මාර්ගයක් මඟින් උද්ධමනය පාලනය කල හැකිද?

I. ඉහල යන ජීවන වියදමට සරිලන සේ වැටුප් වැඩි කිරීම.
II. ආර්ථිකයේ ද්‍රවශීලතා මට්ටම වැඩි කිරීම සඳහා මුදල් සැපයුම වැඩි කිරීම.
III. සමාහාර ඉල්ලුම අඩු කරවන ක්‍රියා මාර්ග ගැනීම.
IV. උපරිම මිල පාලන ක්‍රම අනුගමනය කිරීම.
V. පොළී අනුපාත පහළ හෙලීම.

42)නාමික පොළී අනුපාතය 12%ක්ද උද්ධමන අනුපාතය 4% ක්ද නම් මූර්ත පොළී අනුපාතය.

I. 0.33%කි II. 3% කි III. -3% කි IV. 8% කි V. 16%කි

43)පහත සඳහන් කවර ක්‍රියාමාර්ගයක් මුදල් සැපයුම කෙරෙහි ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති කරයිද?

I. රජයේ වියදම් පහළ නැංවීම II. පොළී අනුපාත පහළ දැමීම III. සාමාන්‍ය මිල මට්ටම ඉහළ යාම
IV.මුදල් සඳහා ඇති ඉල්ලුම ප්‍රසාරණය වීම V. මහ බැංකුවේ ශුද්ධ විදේශ වත්කම් පහළ යාම

44)ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය යනු,

I. ඉල්ලුම් තැම්පතුවක් ආරම්භ කිරීමේදී තැන්පත් කල යුතු අවම මුදල් ප්‍රමාණය වේ.
II. වාණිජ බැංකුවක ඉල්ලුම් තැන්පතු හා ව්‍යවහාර මුදල් අතර අනුපාතය වේ.
III. තැන්පතුවලට අනුපාතිකව වාණිජ බැංකු විසින් පවත්වා ගත යුතු සංචිත ප්‍රමාණයවේ.
IV. වාණිජ බැංකුවක ඉල්ලුම් තැන්පතු වලින් ණය වශයෙන් ලබා දිය හැකි අනුපාතයවේ
V. වානිජ බැංකුවකට ණය මැවිය හැකි වාර ගණන වේ.

SPEEDDEVOFIRST-2022A/L

45)වාණිජ බැංකු පද්ධතිය තුළ කටයුතු කරන එක් වාණිජ බැංකුවකට ලබා දිය හැකි ණය ප්‍රමාණය.

I. ඉල්ලුම් තැන්පතු ප්‍රමාණයට සමානවේ.
II. අධි සංචිත ප්‍රමාණයට සමානවේ.
III. අධි සංචිත මෙන් කිහිප ගුණයට සමාන වේ.
IV. මුදල් ගුණකයෙන් දැක්වෙන ප්‍රමාණයට සමානවේ.
V. තැන්පතු ප්‍රසාරණ සංගුණකයෙන් දැක්වෙන ප්‍රමාණයට සමානවේ.

46)මූල්‍ය පාලන උපතරණයක් වශයෙන් විවට වෙළෙඳපොළ ප්‍රතිපත්තියේ සාර්ථකභාවය සීමා කරන සාධකයක් වනුයේ ,

I. තැන්පතු ප්‍රසාරණ සංගුණකයි.
II. මහජනයා ව්‍යවහාර මුදල් ළඟ තබා ගැනීමට දක්වන කැමැත්තයි.
III. වාණිජ බැංකු කොතෙක් දුරට අවම සංචිත අනුපාතයට අනුගත වන්නේද යන්නයි.
IV. බැංකු පොළි අනුපාතයයි.
V. විදේශ විනිමය අනුපාතයයි.

47)මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරිමක් යනුවෙන් හඳුන්වන්නේ.

I.ප්‍රතිපත්ති පොළි අනුපාතික ඉහළ යාම. II.මුදල් සැපයුම වැඩි කිරිම. III.රජයට ණය දිම සීමා කිරිමයි.

IV.බැංකුවක ලබාදෙන ප්‍රතිමූල්‍ය පහසුකම් නතර කිරිමයි. V. විවට වෙළෙඳපොළේ සුරැකුම්පත් අලෙවි කිරිමයි.

48)එක්තරා කර්මාන්ත ව්‍යාපෘතියකට අදාල ප්‍රතිලාභ හා පිරිවැය දත්ත පහත වගුවේ දැක්වේ.(වටිනාකම රුපියල් මිලියන වලිනි)

පෞද්ගලික ප්‍රතිලාභ 1600	පෞද්ගලික පිරිවැය 1000
බාහිර ප්‍රතිලාභ 200	බාහිර පිරිවැය 300

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට තීරණය කලේ නම්.

I.සමාජ ප්‍රතිලාභ රු.මිලියන200ක් බවයි. II.සමාජ පිරිවැය ඉක්මවූ සමාජ ප්‍රතිලාභ පවතින බවයි.
III.සමාජ ප්‍රතිලාභ ඉක්ම වූ සමාජ පිරිවැයක් පවතින බවයි IV.සමාජ පිරිවැය රු මිලියන 500 ක් බවයි
V.සමාජ ප්‍රතිලාභ රු මිලියන 2600 ක් බවයි.

49.මධ්‍යස්ථ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ක් ක්‍රියාවට නැංවීම නිසා මූර්ත නිෂ්පාදිතය ,

I. රජයේ වියදම් ප්‍රමාණයෙන්ම ඉහළ යාම. II. රජයේ වියදම් ප්‍රමාණයට වඩා ඉහළ යාම.
III.වෙනස් නොවී ස්ථාවර මට්ටමක පවති. IV.සාමාන්‍ය මිල මට්ටම අභිබවා යයි.
V.අඛණ්ඩව පහළ යයි.

50.අනුක්‍රම බදු ක්‍රමයක් පවතින අවස්ථාවක බදු පදනම පුළුල් වුවයොත් පහත සඳහන් කවර සංයෝජනයක් නිවැරදි වේද?

සාමාන්‍ය බදු අනුපාතය	ආන්තික බදු අනුපාතය
1.වෙනස් නොවේ.	ඉහළ යයි
2.පහළ යයි.	ඉහළ යයි
3.ඉහළ යයි	පහළ යයි
4.ඉහළ යයි	ඉහළ යයි
5.ඉහළ යයි	පහළ යයි

SPEDEVOFIRST-2022A/L

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

ආර්ථික විද්‍යාව II

13 ශ්‍රේණිය

පෙරහුරු ප්‍රශ්න පත්‍රය 2022 ජූනි

කාලය පැය තුනයි
විනාඩි 10

"අ" උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද "ආ" උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද තෝරා ගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

''අ'' උප කොටස

මෙම කොටසේ අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.

(01)

I. මූලික ආර්ථික ප්‍රශ්න පැන නැගීමට හේතු දක්වා ඒවා විසඳා ගන්නා ආකාරය අනුව ආර්ථික පද්ධති බෙදා වෙන් කරන අයුරු දක්වන්න. (ල04)

II. වෙළඳ පොළ ආර්ථිකයක දැකිය හැකි දුබලතා කවරේද? . (ල03)

III. ආර්ථික පද්ධතීන්හි කාර්යසාධන අගයන නිර්ණායක 04 ක් ලියන්න. (ල02)

IV. කිසියම් රටක නිෂ්පාදන හැකියාව සම්බන්ධ තොරතුරු පහත දැක්වෙන අතර ආර්ථිකයේ නිෂ්පාදන කාර්යක්ෂමතාව ඇත.

ඇඟලුම්	0	02	04	06	08	10	12
තේ	84	80	72	60	44	24	0

(අ) මීට අදාළ නිශ්පාදන හැකියා මායිම් වක්‍රය ගොඩ නගන්න. (ල04)

(ආ) ඔබ ඇඳි නිශ්පාදන හැකියා මායිම් වක්‍රයේ හැඩයට හේතු දක්වන්න. (ල04)

(ඉ) ඇඟළුම් නිශ්පාදනයට වැඩි සම්පත් ප්‍රමාණයක් යොදවන ආකාරය රූප සටහනේ පෙන්වන්න. (ල03)

(02)

I. ඉල්ලුම හා වුවමනා අතර සම්බන්ධයක් පවතීද? පිලිතුර පැහැදිලි කරන්න. (ල.04)

II. සාමාන්‍ය භාණ්ඩ , බාල භාණ්ඩ, ගිෆන් භාණ්ඩ අතර වෙනස්කම් ,ආදේශන ප්‍රතිවිපාකය, ආදායම් ප්‍රතිවිපාකය හා සමස්ත මිල ප්‍රතිවිපාකය ඔස්සේ පැහැදිලි කරන්න. (ල.06)

III. X භාණ්ඩයේ මිල ඉල්ලුම් නම්‍යතාවය හා ආදායම් ඉල්ලුම් නම්‍යතා සංගුණකය ශූන්‍ය (0) විය. එසේම Y භාණ්ඩයේ මිල සමග X භාණ්ඩයේ හරස් ඉල්ලුම් නම්‍යතාවයද ශූන්‍ය විය. එක් එක් නම්‍යතාවයන්ට අනුව භාණ්ඩයේ ස්වරූපය පැහැදිලි කරන්න. (ල.06)

IV. එක්තරා භාණ්ඩයක මිල ශීඝ්‍ර ලෙස ඉහළ යාමක් සිදු වුවද නිෂ්පාදකයන්ට නිමැවුම වැඩිකිරීමේ හැකියාවක් නොතිබුණි. රූප සටහන් ඇසුරින් මෙම තත්ත්වය පැහැදිලි කරන්න. (ල.04)

(03)

I. ආර්ථික අතිරික්තය අඩුවීම හා අහිමි වන සුබසාධනය යන්න පැහැදිලි කරන්න. .(ල.04)

II. Qd = 120 - 4p හා Qs = -60 + 6p යනු කිසියම් එක් භාණ්ඩයක් සම්බන්ධ ඉල්ලුම් හා සැපයුම් සමීකරණ වේ.
(අ) මීට අදාළ ඉල්ලුම් සැපයුම් වක්‍ර අඳින්න. .(ල.04)
(ආ) මෙම භාණ්ඩය මත රු. 5/= ක සහනාධාරයක් දෙනු ලැබුවහොත් සහනාධාරයෙන් පසු නිශ්පාදන අතිරික්තය, ඔබ ඇඳි රූප සටහනේ අඳුරු කොට පෙන්වන්න. .(ල.04)

III. රජය විසින් වෙළඳපොළට සපයන භාණ්ඩ ප්‍රමාණය සීමා කරන අවස්ථා පවතීද? රූප සටහනක් මගින් පැහැදිලි කරන්න. .(ල.04)

IV. රජය විසින් උපරිම මිලක් පැනවූ විට පාරිභෝගිකයාට සහනයක් ලැබෙන්නේද? ඔබේ පිලිතුර පැහැදිලි කරන්න. (ල.04)

SPEED OF FIRST-2022A/L

(04)

I. ව්‍යාපාර ආයතනයක ආර්ථික ලාභ ශූන්‍ය මට්ටමක පැවතියත් අඛණ්ඩව නිශ්පාදනයේ නිරත වෙයි. පැහැදිලි කරන්න. (ල.4)

II. නිශ්පාදන ආයතනයක පිරිවැය හැසිරීම කෙරෙහි හීන වන ඵල න්‍යාය සහ පරිමාණානුකූල ඵල න්‍යාය බලපාන ආකාරය විස්තර කරන්න. (ල.4)

III. පූර්ණ තරඟ ව්‍යාපාර ආයතනයක භාණ්ඩ සඳහා ඇති ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍ය වන්නේ ඇයි? (ල.4)

IV. පූර්ණ තරඟකාරී ආයතනයක සැපයුම් වක්‍රය වනුයේ සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රයේ අවමයේ සිට ඉහළට දිවෙන ආන්තික පිරිවැය වක්‍රයයි. ඔබ එකඟ වන්නේද? පිලිතුර පැහැදිලි කරන්න. (ල.4)

V. කිසියම් සාධකයක සංක්‍රාම ඉපයුම් වලට වඩා ආර්ථික බදු කුලිය වැඩිවන ආකාරය රූප සටහනක් ඇසුරින් පහදන්න. (ල.4)

(05) (අ) දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේදී පහත දක්වා ඇති දෑ අතුරෙන් කවරක් නිෂ්පාදන ඉමට ඇතුළත් කරන්නේද? ඇතුළත් නොකරන්නේද යන්න දක්වන්න.

I. වසර 5 ක කාලයක් තුල මැද පෙරදිග රැකියාවක නිරත ශ්‍රී ලාංකිකයකුගේ වැටුප

II. සෞදි අරාබියේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සේවය කරන ශ්‍රී ලාංකිකයකුගේ වැටුප

III. ඉන්දියාවේ විශ්ව විද්‍යාලයක මාස හයක කාලයක් උපදේශන සේවා සැපයීමෙන් ශ්‍රී ලංකාවේ මහාචාර්ය වරයෙකු ලබන උපදේශන ගාස්තු **(ලකුණු තුනකි)**

(ආ) පහතින් දැක්වෙන්නේ කිසියම් කල්පිත ආර්ථිකයක 2022 වර්ෂයට අදාළ තොරතුරු රුපියල් බිලියන වලිනි.

කෘෂිකාර්මික අංශයේ එකතු කළ අගය	= 1000
කාර්මික අංශයේ එකතු කළ අගය	= 1600
සේවා අංශයේ එකතු කළ අගය	= 2400
නිශ්පාදිතය මත බදු	= 200
නිශ්පාදිතය මත සහනාධාර	= 300
නේවාසික ආයතන අනේවාසිකයින්ට ගෙවන ලද ප්‍රාථමික ආදායම් ගෙවීම්	= 200
අනේවාසික ආයතන නේවාසිකයින්ට ගෙවන ලද ප්‍රාථමික ආදායම් ලැබීම්	= 150
නේවාසික ආයතන නේවාසිකයින්ට ගෙවන ලද වැටුප් හා වේතන ඇතුලු සියලු සේවක ගෙවීම්	= 300
නිශ්පාදනය මත වෙනත් බදු	= 120
නිශ්පාදනය මත වෙනත් සහනාධාර	= 80
අවශේෂ ලෝකය වෙතින් ලැබුනු ද්විතීක ආදායම් ලැබීම්	= 600
අවශේෂ ලෝකයට ගෙවන ද්විතීක ආදායම් ගෙවීම්	= 400
ගෘහ ඒකක (කුටුම්භ) පරිභෝජනය	= 160
භාණ්ඩ හා සේවා අපනයන	= 300
භාණ්ඩ හා සේවා ආනයන	= 500

අදාළ දත්ත පමණක් තෝරාගෙන 2022 වර්ෂයට අදාළ පහත සඳහන් දෑ ගණනය කරන්න.

I. මූලික මිලට සමස්ත එකතු කළ අගය

II. ආර්ථිකයේ දළ දේශීය නිශ්පාදිතය

SP/DEVO/FIRST-2022A/L

III. දළ ජාතික ආදායම

IV. වැය කළ හැකි දළ ජාතික ආදායම (කොටසකට ල.02 බැගින්)

(ඉ) සරල ආර්ථිකයක ස්වාධීන පරිභෝජනය වියදම රුපියල් මිලියන 200 ක් වශයෙන් පවතී. වැය කළ හැකි ආදායම සමග බැඳුනු කුටුම්භ පරිභෝජනය කුටුම්භ ආදායමෙන් 80% කි. ආයෝජනය රුපියල් මිලියන 800 මට්ටමේ ස්ථාවරව පවතී.

a) ආන්තික ඉතුරුම් නැමියාව කොපමණද? .(ල.01)

b) සමතුලිත ජාතික ආදායම කොපමණද? .(ල.02)

c) සමතුලිත ජාතික ආදායමේදී ඉතුරුම් කොපමණද? .(ල.02)

(ඊ) සේවා වියුක්ති පරතරයක් පවතින තත්වයක් තුල සාර්ව ආර්ථික සමතුලිතය තීරණය වන ආකාරය කේන්සියානු කතිර ආකෘති රූප සටහන මගින් පැහැදිලි කරන්න. .(ල.04)

" ආ " උප කොටස

(මෙම කොටසේ අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.)

(06)

I. උද්ධමනය මිනුම් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ භාවිතා කෙරෙන මිල දර්ශක කවරේද?

II. "උද්ධමනයක් පවතින අතරතුර ඇතැම් භාණ්ඩ මිල ගණන් පහළ යා හැකිය. ඔබ මෙම ප්‍රකාශය හා එකඟ වන්නේද? " හේතු දක්වන්න

III. ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනයක් ඇති වන්නේ කෙසේද? කේන්සියානු න්‍යායට අනුව සුදුසු ප්‍රස්තාර සටහනක් භාවිතා කරමින් පැහැදිලි කරන්න.

IV. රජය මැදිහත් වී ඉහල යන භාණ්ඩ මිල ගණන් උපරිම මිල පාලනයට ලක් කිරීම මගින් උද්ධමනය පාලනය කළ හැකිය. මෙම ප්‍රකාශය හා ඔබ එකඟ වන්නේද? හේතු සහිතව පැහැදිලි කරන්න.

V. උද්ධමනයේ ආර්ථික පිරිවැය කවරේද? (ල.4x5)

(07)

I. "වාණිජ බැංකු අරමුණු අතර ආර්ථික ගැටුමකට මුහුණ දෙයි." මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ල.04)

II. වාණිජ බැංකු ශේෂ පත්‍රයක ද්‍රවශීල වත්කම් හා අද්‍රවශීල වත්කම් ලැයිස්තු ගත කර දක්වන්න. .(ල.06)

III. වාණිජ බැංකු පද්ධතිය තුළ කටයුතු කරන එක් වාණිජ බැංකුවක රුපියල් මිලියන 1000 ක මුදලක් තැන්පත් වූ බවත් , බැංකුව 10% ක ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයකට යටත්ව කටයුතු කරන බවත් සලකන්න.

(අ) මෙම බැංකුවට ලබාදිය හැකි උපරිම ණය ප්‍රමාණ කොපමණද?

(ආ) ණය මුදල ලබා දුන් පසු බැංකුවේ ශේෂ පත්‍රය කෙසේ වේද?

(ඉ) ණය මුදලට අදාල චෙක්පත් සියල්ල වෙනත් තැන්පත් වූයේ නම් මෙම බැංකුවේ හෙහස පත්‍රය කෙසේ වේද? (ල.2x3)

IV. මුදල් මැවීමේ ක්‍රියාවලිය පැහැදිලි කිරීම සඳහා අවශ්‍ය උපකල්පන කවරේද? (ල.04)

SPEEDEVOFIRST-2022A/L

(08)

I. මුදලේ කාර්යයන් කවරේද? . (ල.02)

II. මහජනතාව සතු කාසි හා නෝට්ටු 80

මහජනයා සතු වාණිජ බැංකු වල ඇති කාසි හා නෝට්ටු 30

වාණිජ බැංකු නමින් මහ බැංකුවේ ඇති කාසි හා නෝට්ටු 10

වාණිජ බැංකු සතු ඉල්ලුම් තැන්පත් 100

වාණිජ බැංකු සතු කාලීන හා ඉතුරුම් තැන්පත් 60

අනේවාසිකයන්ගේ විදේශ ව්‍යවහාර මුදල් තැන්පත් ගිණුම් වල (50%) 40

නේවාසිකයන්ගේ විදේශ ව්‍යවහාර මුදල් තැන්පත් ගිණුම් 20

ඉහත දැක්වෙන්නේ එක්තරා ආර්ථිකයක මුදල් සැපයුම් සම්බන්ධ දත්ත වේ.පහත සඳහන් දෑ ගණනය කරන්න.

(අ) අධි බලැති මුදල් සැපයුම./පදනම් මුදල්(ල.02)

(ආ) පටු මුදල් සැපයුම හා (M_1) මුදල් ගුණකය .(ල.03)

(ඉ) M_2b මුදල් සැපයුම හා මුදල් ගුණකය (M_2b) .(ල.04)

III. ද්‍රවශීලතාවරණය යන්න පැහැදිලි කරන්න. .(ල.04)

IV. ආදායම හැරුණු විට මුදල් ඉල්ලුම කෙරෙහි බලපාන වෙනත් සාධක ලියන්න. .(ල.03)

V. සංසරණ ප්‍රවේගය යන්න අර්ථ කථනය කරන්න. .(ල.02)

ව්‍යුහගත

(09)

I. රජයකට ආදායම් ලැබෙන මූලාශ්‍ර කවරේදැයි නම් කරන්න. .(ල.06)

II. මෑත වර්ෂ වලදී රජයේ ආදායම ද.දේ.නිෂ්පාදිතයට සාපේක්ෂව විශාල වශයෙන් පහළ මට්ටමක පැවතීමට හේතු කවරේද? .(ල.04)

III. “ ශ්‍රී ලංකාවේ පනවන වක්‍ර බදු වල ප්‍රතිවිපාකය ප්‍රතික්‍රම බලපෑම් සහිත වේ. " මෙම ප්‍රකාශයෙන් අදහස් වන්නේ කුමක්ද? .(ල.02)

IV. වක්‍ර බදු වල ප්‍රතික්‍රම බලපෑම අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග කවරේද? .(ල.04)

V. රටක ආර්ථික වෘද්ධියට හේතු වන ලෙස බදු ක්‍රමය යොදා ගත හැක්කේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ල.04)

(10)

I. වෙළඳපොළ අසමත් වීම් යනුවෙන් කුමක් අදහස් වේද? .(ල.02)

II. වෙළඳපොළ අසමත් වීම් ඇති වන්නේ කවර හේතු නිසාද? .(ල.04)

III. පෞද්ගලික පිරිවැය, බාහිර පිරිවැය හා සමාජ පිරිවැය යන සංකල්ප පැහැදිලි කරන්න. .(ල.06)

IV. පරිභෝජනයේ ධන බාහිරතා පවතින අවස්ථාවක හා පරිභෝජනයේ ඍණ බාහිරතා පවතින අවස්ථාවක වෙළඳපොළ අසමත් වීම් සිදුවන ආකාරය රූප සටහන් යොදා ගනිමින් පැහැදිලි කරන්න. .(ල.06)

V. බාහිරතා පාලනය කළ හැකි ක්‍රම දෙකක් නම් කරන්න. .(ල.02)

SPEED OF FIRST -2022A/L